# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 502 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 22/03/2024<br>පැය 0900 |

**මාධ්‍ය නිවේදනය**

**01. මාරක රිය අනතුරක් - බියගම පොලිස් වසම.**

2024.03.21 වන දින රාත්‍රී කාලයේ බියගම පොලිස් වසමේ බියගම බණ්ඩාරවත්ත මාර්ගයේදී බියගම දෙස සිට බණ්ඩාරවත්ත දෙසට ධාවනය වූ කැබ් රථයක් පාර හරහා ගමන් කළ පදිකයකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා බියගම රෝහලෙන් වැඩිදුර ප්‍රතිකාර සඳහා රාගම රෝහලට ඇතුලත් කර න ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 47 ක් වන කල්කුඩා ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුරට සම්බන්ධ කැබ් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර බියගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. මාරක රිය අනතුරක් - කරදියනාරු පොලිස් වසම.**

2024.03.21 වන දින සවස් කාලයේ කරදියනාරු පොලිස් වසමේ බදුල්ල වෙන්කල්අඩි මාර්ගයේදී කරදියනාරු දෙස සිට වෙන්කල්අඩි දෙසට ධාවනය වූ මඩකලපුව මහ නගරසභාවේ කැළිකසල ඉවත් කරන රථයක් කොඩුවාමඩු ඉන්ධන හල අසල ආපදා තත්වයක් හේතුවෙන් නතර කර තිබියදී එම දිශාවටම ධාවනයවූ යතුරු පැදියක් එම රථයේ පසුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පැදිකරු වෙන්කල්අඩි රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 55 ක් වූ වෙන්කල්අඩි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුරට සම්බන්ධ නගර සභා රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර කරදියනාරු පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**